**චන්දිම ගුණසේන**
ව්‍යාපෘති සහකාර, PCB ශ්‍රී ලංකා
පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණ අංශය

# භූදේශපාලනය (Geopolitics) - දේශීය භූගෝලීය තත්වයන්ට සාපේක්ෂකව වටහා ගැනීම

විකිපීඩියා ශබ්දකෝෂයට අනුව භූදේශපාලනය යනු දේශපාලනය සහ ජාත්‍යන්තර සබඳතා සඳහා පෘථිවියේ භූගෝලීය (මානව හා භෞතික) බලපෑම් ගැන අධ්‍යයනය කිරීම ලෙස දක්වා ඇත. ඒමෙන්ම කේම්බ්‍රිජ් ශබ්දකෝශයට අනුව භූදේශපාලනය යනු රටක විශාලත්වය, පිහිටීම යනාදිය එහි බලයට සහ අනෙකුත් රටවල් සමඟ ඇති සබඳතාවලට බලපාන ආකාරය අධ්‍යයනය කිරීමයි.

පුරාණ කාලයේ ග්‍රීසියේ භූදේශපාලනය පිලිබඳව නොයෙක් මතවාද පිලිදව සාකච්ඡා කෙරිණි. ග්‍රීක නගර රාජ්‍යය සහ අසල්වැසි අධිරාජ්‍යයන් සහ විවිධ ගෝත්‍රවල දේශපාලනික ක්‍රමවේදයන් අදාල ප්‍රදේශයේ දේශගුණික තත්ත්වයන් සමඟ දක්වන සහසම්බන්ධතාවය පිලිබඳව ඇරිස්ටෝටල් (ක්‍රි.පූ. 384) කරුනු දක්වා ඇත. 1724 දී ජර්මානු දාර්ශනිකයෙකු වූ ඉමානුවෙල් කාන්ට් මිනිසුන්ගේ ක්‍රියාවන් සහ දේශගුණික සාධක අතර සහසම්බන්ධතාවය පිලිබඳව අදහස් දක්වන ලදී. ස්වීඩන් දේශපාලන විද්‍යාඥයෙකු වන රුඩොල්ෆ් කෙලොන් (1864) නම් වූ දාර්ශනිකයා විසින් භූදේශපාලනය, ජනගහනයේ පැතිරීම, ආර්ථික, දේශපාලන, සමාජීය හා භූගෝලීය සාධක මත රාජ්‍යයන්ගේ සියලු ජීවීන්ගේ පැවැත්ම පිළිබඳව සාකච්චා කෙරෙන විද්‍යාවක් ලෙස අර්ථ දැක්වා ඇත.

1946 දී නිකලස් ස්පයික්මන් නම් වූ විශාරදයෙක් ජාත්‍යන්තර සබඳතා රටක භූගෝලීය තත්වයන් නැතහොත් රාජ්‍යයක භෞතිකත්වය මත තීරණය වන බව අවධාරනය කළ අතර දේශපාලනඥයින් කාලයත් සමඟ වෙනස්වන නමුත් රටක ස්වභාවික පරිසරයේ පවතින, කඳු වැටි ආදිය ඒවැනි කෙටිකාලීන වෙනස් වීම්වලට භාජනය නොවී පවතින බව උදාහරණයක් ලෙස ගෙන හැර දක්වා ඇත. හවුෂෝෆර් (1934) සහ තවත් ජර්මානු භූගෝල විද්‍යාඥයින්ට අනුව රටක් වශයෙන් ජර්මනියට කාර්මිකරණයේ දී අධිකාරී බලයක් හිමිවන බවත් අප්‍රිකාව සහ යුරෝපීය රටවල් අමුද්‍රව්‍ය සපයන්නන් ලෙස ක්‍රියා කළ යුතු ආකාරය න්‍යායක් ලෙස ඉදිරිපත් කර සාකච්චා කර ඇත.මෙම න්‍යායට අනුව කටයුතු කිරීම නිසා අප්‍රිකාවේ ස්වභාවික සම්පත් අධිපරිභෝජනයට ලක් වූ බව පැහැදිලි වන අතර අඛණ්ඩව සිදුවූ මෙම සූරාකෑම හේතුවෙන් රටක් වශයෙන් අප්‍රිකාවට තමන්ගේම දේශීය භූගෝලීය තත්වයන් රැක ගැනීමටද නොසැකි විය.

එමෙන්ම පෘථිවියේ නිවර්තන කලාපයට අයත් රටවල්වලට අයත් ස්වභාවික සම්පත් චීනය විසින් අධිපරිභෝජනයට ගැනීම තවත් හොඳ උදාහරණයකි. එම රටවල් සමූහය චීනයේ මුතු පට ලෙසින්ද හඳුන්වා ඇත (රූපය 1). තවද චීනය වැනි රටවල් ඝර්ම කලාපීය රටවල්වල ස්වභාවික සම්පත් පරිභෝජනය කිරීමේ දී ඒම රටවල දේශිය භූගෝලීය තත්වයන් පිලිබඳව

අවධානය යොමු නොකිරීම හා නිසි පරිදි කලමණාකරනය නොකිරීම නිසා ගෝලීය වශයෙන් දේශගුණික අර්බුදයන්ට තුඩු දෙන පාරිසරික බලපෑම් ඇති වීමට හේතු වී ඇති අතර මෙම අයහපත් පාරිසරික බලපෑම් යතා තත්වයට පත් කිරීම අද දවසේ ගෝලීය අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

කෙසේ වෙතත් වර්තමාන හා අතීතයේ පැවති භූදේශපාලනය පිලිබඳව දක්වා ඇති නිර්වචනයන්, පරිසර පද්ධති සේවා හා ප්‍රත්‍යාස්ථතාව සමබර කිරීමේ අවශ්‍යතාවය ප්‍රජා වගකීමක් ලෙස සලකා කටයුතු කිරීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය පෙන්වා දීමට අපොහොසත් වී ඇත. මෙම ක්‍රමවේදය මේ අයුරින් අර්ථ දක්වා නොතිබුනත්, අතීතයේදී ශ්‍රී ලංකාවේ මෙවැනි පරිපාලන ක්‍රමවේදයක් පැවති බවට සාධක හමුවේ.




රූපය 1 - චීනයේ මුතු පට ලෙසින් හැඳින්වෙන රටවල් සමූහය

භූදේශපාලනික ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවේ ක්‍රි.පූ 600 දක්වා දිවෙන ගංගා ද්‍රෝණි මායිම් මත පදනම්ව රාජධානි පැවති බවට සාධක පවතින අතර එම පරිපාලන ව්‍යුහය ඉපැරණි ජල ශිෂ්ටාචාරය ලෙස වර්තමානයේ හඳුන්වන අතර මෙම පරිපාලන ක්‍රමවේදයේදී පුරවැසියන්ගේ සාමුහික සහභාගීත්වයෙන් හා දේශපාලන මැදිහත්වීමෙන් ප්‍රාදේශීය භූගෝලීය තත්වයන් හොඳින් නඩත්තු කරන ලදී. මේ සඳහා ගංගා වල ගලා බසින ජලය හා වැසි දිය කළමනාකරණය කිරීමට සුළු, මධ්‍යම හා මහා පරිමාන වාරි ඇලවල් හා එකිනෙකට යා වූ වැවු පද්ධතීන් යොදා ගත් අතර ඒවායේ නඩත්තු කටයුතු රජයේ අනුග්‍රහයෙන් මහජනයාගේ වගකීමක් ලෙස ඉටු කිරීමට කටයුතු සලසා තිබිණි. මේ ආකාරයට දේශිය භූගෝලීය හා පාරිසරික තත්වයන් ඉතාමත් කාර්යක්ෂමව පාලනය කිරීම නිසා ලංකාවේ තිරසාර වූ ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාමට හැකිවූ අතර ස්වාභාවික සම්පත් හොඳින් කළමනාකරණය කර ජාත්‍යාන්තර වානිජ කටයුතු ද හොඳින් පවත්වා ගැනීමටද හැකි වී ඇත.

ක්‍රි.පූ. 384 දී ඇරිස්ටෝටල් විසින් සාකච්චා කරන ලද දේශගුණික තත්ත්වයන් පදනම් කරගත් භූදේශපාලනය පිලිබඳවූ මතවාදය ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති ජල ශිෂ්ඨාචාරය මත පදනම් වූ පරිපාලන ක්‍රමවේදය මගින් තෘප්තිමත් වන අතර ඇරිස්ටෝටල් නැමති දාර්ශනිකයාට වසර දහස් ගණනකට පෙර සිටම භූගෝලීය සාධක සහ දේශගුණික සාධක මත පරිපාලන කටයුතු මෙහෙය වීමේ ක්‍රමවේදයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වී ඇති බවට අදටත් සාධක පවතී.

සී. පී. ගුණසේන (2021) භූදේශපාලනය යන්න රටක මහජනයාගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම වෙනුවෙන්, පාලකයන් ප්‍රජාව සමඟ වගකීම් හුවමාරු කර ගැනීමේදී, සියළුම පරිසර පද්ධති සේවාවන් කළමනාකරණය කිරීමට මහජන සහභාගීත්වයෙන් තිරසාර පැවැත්මක් සඳහා ඉහළ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව ඇති ප්‍රජා සහභාගීත්ව පාලනයක් සහිත සමාජ දේශපාලන ප්‍රවේශයක් ලෙස අර්ථ දක්වා ඇති අතර, රටක් ගෝලීය වශයෙන් යහපත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කර ගනිමින් එම රටේ භූගෝලීය හා දේශගුණික තත්වයන්ට ගැලපෙන පරිදි නිෂ්පාදන හා අළෙවිකරණ රටාවක් පවත්වාගෙන යාමට දේශීය මෙන්ම ගෝලීයව කාර්යක්ෂමව ක්‍රියාත්මක වන සැපයුම් දාම කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීමෙන් ජාත්‍යන්තර සබඳතා වඩාත් තිරසාර ලෙස පවත්වා ගැනීමට රජයන් විසින් පිළිපැදිය යුතු ආචර්ය ධර්ම පද්ධතියක් ලෙසද හඳුන්වා දී ඇත.

## නිගමනය

භූදේපාලනය පිලිබඳව ඇති මතවාදයන් හා න්‍යායන් සාරාංශගත කිරීමෙන් ඇඟවෙන්නේ, අදාල ස්ථානය සහ එම ස්ථානයේ භෞතික භූගෝලීය කරුණු සලකා බලා එම කරුණුවලට අදාලව දේශපාලනඥයින්ට උපදෙස් ලබා දීම මත පදනම් වූ දේශපාලනයක් භූදේශපාලනය හැඳින්විය හැකිය. ඒ අනුව යම් රටකට විශිෂ්ට ජාත්‍යන්තර සබඳතා තිබිය හැකි නමුත් දේශීය භූගෝලීය කොන්දේසි මැනවින් කළමනාකරණය නොකළ හොත් එය ජාත්‍යන්තර සබඳතා තිරසාර ලෙස පවත්වාගෙන යාමට සෘජුවම බලපානු ඇත. එම නිසා, ඕනෑම රටක් පළමුවෙන්ම තම රටේ භෞතික යථාර්ථය ආරක්ෂා කරගැනීමට ක්‍රියා කිරීම අඛණ්ඩ හා ගතික ජාත්‍යන්තර සබඳතා පවත්වා ගැනීමට මහත්සේ උපකාරවනු ඇත.

කෙසේ වෙතත් වර්තමාන දේශපාලන රාමුව තුළ ලබා ගත් භෞතික දියුණුව තිරසාර නොවෙන බව පැහැදිලි වෙමින් පවතී. ලංකාවේ අතීතයේ පැවති ජල ශිෂ්ටාචාරය හා ඒ හා බැඳුනු පරිපාලන ක්‍රමවේදයට සාර්ථකව දේශීය භූගෝලීය තත්වයන් සහ ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කර ගැනීමට හැකි වූයේ රාජ්‍ය පාලනයේදී භූ විෂමතාවයන් පිලිබඳවත් දේශීය ස්වාභාවික පරිසර පද්ධතීන්ගේ තිරසාර බවත් සලකා රටේ ස්වාභාවික සම්පත් කළමනාකරණයේදී ප්‍රජා සහභාගීත්වයට මුල්තැන දෙමින් ක්‍රියාත්මක වූ පරිපාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීම නිසාවෙනි. ඒබැවින් සෘජු මහජන සහභාගීත්වයකින් යුතු භූමියේ හැඩතල හා ස්වභාවික ජලවහන රටා පදනම් කරගත් මෙම ශ්‍රීලාංකික පරිපාලන ක්‍රමවේදය වැනි පරිපාලන ක්‍රමවේදයක් අනාගත ලෝකයේ තිරසාර බව සඳහා වඩා යහපත් භූදේශපාලන ක්‍රමවිදයක් ඇතිකිරීමට ඉවහල් වනු ඇත.

**මූලාශ්‍ර**


1. https://en.wikipedia.org/wiki/Geopolitics

2. https://dictionary.cambridge.org/dictionary/english/geopolitics

3. Sören Scholvin, 2016, GEOPOLITICS AN OVERVIEW OF CONCEPTS AND EMPIRICAL EXAMPLES FROM INTERNATIONAL RELATIONS, FIIA Working Paper 91, Institute of Economic and Cultural Geography, University of Hanover, Visited on July 15, 2021 Geopolitics: An Overview of Concepts and Empirical Examples from International Relations (ethz.ch)

4. Sri Lankan "Ellanga" ecological system was referred from work done by Prof. C.M. Maddumabandara, Dr. M.U.A. Thennakoon and Dr. P.B. Dharmasena

5. C.P. Gunasena (2021), Geopolitics definition, https://www.researchgate.net/publication/353548428_Definition_Geopolitics_2021

6. චීනයේ මුතු පට https://www.researchgate.net/figure/The-String-of-Pearls-of-China-and-ports-of-the-Chinese-Navy-in-the-Indian-Ocean-Arena_fig5_318959775


